# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,567—1940ක්වූ ජනවාරි මස 12 වෙනි දිනවූ සිකුරාදා.



## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

වැලිකඩ පිහිටා තිබෙන ආණ්ඩුවේ ඉඩම බංගලාවල් සෑදීම පිණිස බදුදීම.

කොළඹ නාගරිකය තුල වැලිකඩ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් ආණ්ඩුවේ ඉඩමේ බංගලාවල් සෑදීම සඳහා 99 අවුරුද්දේ බද්ද වශ 1940ක්වූ මාර්තු මස 7වෙනි දිනවූ බ්‍රහස්පතින්දා කොළඹ කච්චේරියේදී ප්‍රසිද්ධ වෙන්දේසියෙන් විකුණනු ලැබේ.

මෙම බද්ද විශේෂ කොන්දේසි පිට විකුණනු ලැබේ. එම කොන්දේසිවල කොපියක් කොළඹ කච්චේරියට ඇවිත බලාගත හැක.

කොළඹ නාගරිකය තුල වැලිකඩ පිහිටා තිබෙන නො. A 869 මුල් සිතියමේ පෙනෙන ඉඩම.

| සිත කැබලිය. | ඉඩමේ නම. | ඉඩමේ විස්තරය. | බිම්ප්‍රමාණ අ. රූ. ප. | | | | | එක එක පළමුවෙනි අවුරුදු 30ට අවුරුදු බද්ද. රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3 .. | කොටා රෝඩ් වර්පනම් නො. 281 (කොටසක්) | වත්ත .. | 0 | 0 | 28·92 .. | 122 | 0 .. | 112 | 0 |
| 4 .. | එම .. | එම .. | 0 | 0 | 22·71 .. | 98 | 0 .. | 88 | 0 |
| 5 .. | එම .. | එම .. | 0 | 0 | 24·25 .. | 118 | 0 .. | 108 | 0 |
| 7 .. | එම .. | එම .. | 0 | 0 | 22·54 .. | 109 | 0 .. | 99 | 0 |
| 8 .. | එම .. | එම .. | 0 | 0 | 23·80 .. | 154 | 0 | 144 | 0 |
| 9 .. | එම .. | එම .. | 0 | 0 | 24·30 .. | 160 | 0 .. | 150 | 0 |

(Price column headers: රු. ශ.)

අවුරුදු 30කට වරක් බදු මුදල වෙනස් කල හැක. මේ ගැන වැඩි විස්තර බස්නාහිර දිසාවේ දිසාපතිතුමාගෙන්ද, සිතියම සර්වේයර් ජනරාල්තුමාගෙන්ද ලබාගත හැක.

වශ 1940ක්වූ ජනවාරි මස 3වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—දූනගහඇලේ අමුණක් බැඳීම සඳහා මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකාරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" පස්වෙනි වගන්තියේ හරතිබෙන පංගාර්තුවල ප්‍රකාර යව පලාත් ආණ්ඩු කාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් ලැබීතිබෙන බලයපිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,068. ගම—දූනගහ සහ අදිකාරීමුල්ල.

| නො. | ඉඩමේ නම. | ආරක්ෂම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 1 | තිත්තගහවත්ත .. | අවුරුදු 5–12 වයස පොල්ගහක් සහ කිතුල්ගහක්ද, අරින සාදනලද වේලි ලක කොටසක්ද ඇති පොල් ඉඩම | තොරකල්ජේඩිගේ එමානිස්, අදිකාරීමුල්ල | 0 | 0 | 11·3 |
| 2 | එම .. | අවුරුදු 15ක් වයස පුවක්ගස් 5ක්ද, අවුරුදු 5ක් වයස පුවක්ගස් 3ක්ද, තොරක ගහක්ද, කිතුල්ගහක්ද, උනපඳුරක්ද, අරින සාදනලද වේල්ලක කොටසක්ද ඇති පොල් ඉඩම | තොරකල්ජේඩිගේ බබුන්චිය, අදිකාරීමුල්ල | 0 | 0 | 15·9 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 3 | දවටගහකුඹුර .. | කඩිගලක්ද, අළුත සෑදූනලද වේල්ලක්ද, දියඇදුරක් සහ නියරක්ද (ඇති පුරාණ කුඹුර) | හෝරතල්පේඩිගේ සොමින්දුව සහ හොර තල්පේඩිගේ අංගොස්තිනා, දූනගහ | 0 1 7·3 |
| 4 | දූනගහඇල .. | මුඩුබිම (පුරාණ ඇලේ කොටසක්) .. | රජයන්තක .. .. | 0 0 2·4 |
| 5 | දවටගහකුඹුර .. | මුඩුබිම (අත්හරිනලද කුඹුර) .. | කුලන්දආරච්චිලාගේ කාරෝලිස් ගුණ රත්න, කුලන්දආරච්චිලාගේ ජයසිංහ අප්පුහාමි, කුලන්දආරච්චිලාගේ කුල රත්න සහ කුලන්දආරච්චිලාගේ ගුන පාල, දූනගහ | 0 0 5·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඔහුකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1940ක්වූ පෙබරවාරි මස 10වෙනි දින පෙරවරු 9ට අළුතපොල ආණ්ඩුවේ සවභාෂා පිරිමි පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඔහුවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහු බව මෙයින් දූනගත යුතුයි.

වම් 1940ක්වූ ජනවාරි මස 8වෙනි දින ඒ. සී. ඇම්. හිංලි,
කොළඹ කච්චේරියේදීය. ——— ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

(203වෙනි පරිච්ඡේදය—ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රය යටතේ) ආණ්ඩුවේ කවයුත්තකට, ඒනම්:— තංගල්ලේ මැද කැටියේ සර්කියුලර් පාර පලල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදය)" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංනාර්තුවල ප්‍රකාරයෙව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

අවසාන ගම් සිතියමේ නො. 315, අතුරු සිතියමේ නො. 6. ගම—මැඩිල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 8M | නාගරික නො. 836ගේ කොටසක්වූ පලූගහ වත්ත | මැටිගසනලද උළු සෙවිලිකරපු ගෙයකින් කොටසක් සහිත හිස්ඉඩම | තංගල්ලේ පදිංචි ඒ. පී. පින්චෝහාමි සහ ඩී. ඩී. එදිරිසූරිය | 0 0 0·15 |
| 8Q | නාගරික නො. 596 .. | උළු සෙවිලිකරනලද බදුම ගෙයක් | මැදකැටියේ පදිංචි ආර්. පී. තෝන්තෝහාමි, නැසීගිය ඩී. දොන් මනෙකස්ගේ උරුමක් කාරයෝවන නාවලපිටියේ තැපැල්කන් තෝරුවේ පදිංචි පැන්සි නන්දාවති දළු වත්ත සහ පී. ඒ ජයසේකර | 0 0 1·77 |
| 8BF | නාගරික නො. 573ගේ කොටසක්වූ ජම්බුගහ වත්ත | හිස්ඉඩම .. .. | තංගල්ලේ පදිංචි ඒ. කේ. පී. හෙන්ද්‍රික් සිංඤෝ | 0 0 1·35 |
| 8BG | නාගරික නො. 573B කොටසක්වූ කරගහ වත්ත | මැටිගසනලද උළු සෙවිලිකරපු ගෙයක් සහිත හිස්ඉඩම | මාතර පදිංචි ඇන්. ඒ. වික්‍රමසූරිය .. | 0 0 2·07 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහුකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1940ක්වූ පෙබරවාරි මස 13වෙනි දින පෙරවරු 10ගේ කච්චේරියට තංගල්ලේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔහුවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහු බව මෙයින් දූනගත යුතුයි.

වම් 1940ක්වූ ජනවාරි මස 6වෙනි දින සී. සිත්තම්පලම්,
හම්බන්තොට කච්චේරියේදීය. ——— ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

(203වෙනි පරිච්ඡේදය—ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රය යටතේ) ආණ්ඩුවේ කවයුත්තකට, ඒනම්:— ඉලුක්මුල්ල පාඨශාලාවට සෙල්ලම්පිට්ටනියක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203වෙනි පරිච්ඡේදය)" 5වෙනි කාණ්ඩයේ කරතිබෙන පංනාර්තුවල ප්‍රකාරයෙව උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 290ගේ අතුරු සිතියමේ නො. 6. ගම—තලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 409 | මැදහේන හොහොත් මහ හේන | හේන (පාඨශාලා සෙල්ලම් පිට්ටනියක කොටසක්) | දොන්දියස් රජපක්ෂ මුහසිංපතිරන, හිවපූ පොලිස් විදිසර, සියඹලාගොඩ | 0 0 2·2 |
| 412 | එම .. | එම .. | දොන්දියස් රජපක්ෂ මුහසිංපතිරන, හිවපූ පොලිස් විදිසර, සියඹලාගොඩ, බාලමාහගේ දොන්දිරිස්අප්පු, සිරිභාලූව සහ ලියනගම කන්කානම්ගේ දොන් අන්ද්‍රයස්, තලගම | 0 0 21·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහුකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑම්දෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1940ක්වූ පෙබරවාරි මස 13වෙනි දින පෙරවරු 11 කච්චේරියට තංගල්ලේ නානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔහුවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහු බව මෙයින් දූනගත යුතුයි.

වම් 1940ක්වූ ජනවාරි මස 6වෙනි දින සී. සිත්තම්පලම්,
හම්බන්තොට කච්චේරියේදීය. ——— ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

(ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 203වෙනි කොට්ඨාසයේ 6වෙනි වගන්තිය.)

ආණ්ඩුකාරතුමාගේ අනුඥාව යටතේ වම් 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 6වෙනි කාණ්ඩයේ කරතිබෙන පංනාර්තුවල ප්‍රකාරයට ආණ්ඩුවේ කවයුත්තකට, මන්ඩසිනිම්බි මුඩුක්කුනාරක් ඇරීමට සහ වතුරගමට ඇලක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වන ඉඩම් ලබාගැනීමට ක්‍රියාකරන ලෙස ප්‍රදේශ පාලනයකරන මණ්ඩලයේ කොමිටියෙන් මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

ප්‍රාරම්භ සිතියමේ නො. A 1,272. ගම—මන්ඩදූපත.

| බිම් කට්ටිය. | ඉඩමේ නම. | තොරතුරු. | අයිතිකාරයින්. | ප්‍රමාණය, අ.රූ.ප. |
|---|---|---|---|---|
| 1 | කොල්ලිපට්ටි .. | වෙල්ඉඩම .. | මන්ඩදූවේ පදිංචි අන්නකිලි චිනාසිතම්බි මැතිනිය .. | 0 0 9·4 |
| 2 | එම .. | එම .. | තංගම් කුලංදවේලු මැතිනිය .. .. | 0 0 2·1 |
| 3 | එම .. | එම .. | පොන්නම්පලම් කාත්තිගේසු මැතිනිය .. .. | 0 0 2 |
| 4 | එම .. | එම .. | පොන්නම්පලම් කාත්තිගේසු .. .. | 0 0 2·1 |
| 5 | එම .. | එම .. | පොන්නම්පලම් චිනායමුත්තු .. .. | 0 0 2·1 |
| 6 | එම .. | එම .. | වී. සුබ්‍රමනියම්මා මැතිනිය .. .. | 0 0 10·8 |
| 7 | එම .. | එම .. | සින්නතම්බි අප්පාකුට්ටි සහ සින්නතම්බි මානික්කම් .. | 0 0 1·9 |
| 8 | එම .. | එම .. | සින්නච්චිමා කනගසබේ මැතිනිය .. .. | 0 0 2 |
| 9 | එම .. | එම . | සෙවෙන්ති සන්දියාපුල්ලේ, සෙවෙන්ති රසප්පු, මැරීයම්මා සවාමිපුල්ලේ මැතිනිය සහ අන්නපූරනී පිටර් මැතිනිය | 0 0 4 |

| සිතියම් කට්ටිය. | ඉඩමේ නම. | තොරතුරු. | අයිතිකාරයින්. | ප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 10 | සන්නාන්වයල් .. | වෙල්ඉඩම .. | සෙල්ලතම්පි ඒරම්බු .. | 0 0 3·5 |
| 11 | එම .. | එම .. | කේ. කන්දසියා මැතිනිය .. .. | 0 0 2·9 |
| 12 | එම .. | එම .. | මයිලුවගිත්තිලිංගම් හා සින්නදුරෛසිගේ දුව නෙසාතනියම්මාද | 0 0 4·5 |
| 13 | එම .. | එම .. | පොන්නම්පලම් කාත්තිගේසු, පොන්නම්පලම් විනායමූර්ති සහ පොන්නම්පලම් සිදම්පරනාදන් | 0 0 5 |
| 14 | එම .. | එම .. | සෙගපාක්කිය ලච්චුමි කන්දසියා .. .. | 0 0 9·7 |
| 15 | එම .. | එම .. | මනෝන්මනි තම්බයියා .. | 0 0 2·7 |
| 16 | එම .. | එම .. | පී. සිතම්පරනාදර්, පී. කාත්තිගේසු සහ පී. විනායමූර්ති .. | 0 0 3·9 |
| 17 | එම .. | එම .. | ඇස්. සිතම්පරනාදර් .. .. .. | 0 0 1·8 |
| 18 | එම .. | එම .. | කේ. සරවනමුත්තු සහ වෙට්ටිවේලු .. .. | 0 0 1·8 |
| 19 | එම .. | එම .. | ඇන්. වෙට්ටිවේලු මැතිනිය .. .. | 0 0 3·8 |
| 20 | එම .. | එම .. | සුබ්‍රමනියම් ගුනරත්නම්, ඇම්. කන්දරඩියාර් මැතිනිය, ඇම්. නවසිවායම් මැතිනිය සහ ඒ. අයියාතුරෛ මැතිනිය | 0 0 2·4 |
| 21 | එම .. | එම .. | අන්තෝ යක්කෝ .. .. .. | 0 0 1·5 |
| 22 | එම .. | එම .. | සෙල්ලම්මා සෙල්ලප්පා මැතිනිය .. .. | 0 0 2 |
| 23 | එම .. | එම .. | ඇන්. වෙට්ටිවේලු .. .. .. | 0 0 3·1 |
| 24 | එම .. | එම .. | ටී. සුබ්‍රමනිය සුවාමි .. .. | 0 0 1·7 |
| 25 | එම .. | එම .. | මයිලු සුප්පිරමනියම් .. .. .. | 0 0 2·5 |
| 26 | එම .. | එම .. | පේදුරු සෝවාන් .. .. .. | 0 0 3 |
| 27 | එම .. | එම .. | වී. කාත්තිගේසු මැතිනිය .. .. | 0 0 3 |
| 28 | එම .. | එම .. | සෝමසුන්දරම් තියාගරාජ සහ සෝමසුන්දරම් නඩරාජ .. | 0 0 4·1 |
| 29 | එම .. | එම .. | ක්‍රිස්තියානා ඉරසිමාන්දු මැතිනිය .. .. | 0 0 2·5 |
| 30 | එම .. | එම .. | පිලිප්පු මඩුත්තීනා, පිලිප්පු යක්කෝ සහ පිලිප්පු රාසප්පු .. | 0 0 3·5 |
| 31 | එම .. | එම .. | වීරකාත්ති කාත්තිගේසු .. .. | 0 0 1·5 |
| 32 | මනල්වයල් .. | එම .. | සෙව්වෙත්ති ඥානප්‍රකාසම් සහ සෙව්වෙත්ති රාසප්පු .. | 0 0 3·1 |
| 33 | එම .. | එම .. | සව්පාක්කිය ලෙච්චුමි කන්දසියා මැතිනිය .. | 0 0 4·5 |
| 34 | එම .. | එම .. | තෙයිවානෛ සෙව්වෙත්ති .. .. | 0 0 2·7 |
| 35 | එම .. | එම .. | ඇස්. අප්පාකුට්ටි මැතිනිය .. .. | 0 0 3 |
| 36 | එම .. | එම .. | සින්නතම්බිගේ වැද්දමු පාරුපති .. .. | 0 0 1·5 |
| 37 | එම .. | එම .. | අච්චිකුට්ටි සිතම්පරනාතර් මැතිනිය .. .. | 0 0 8·9 |
| 38 | එම .. | එම .. | සව්පාක්කිය ලෙච්චුමි කන්දයා මැතිනිය .. | 0 0 7·6 |
| 39 | එම .. | එම .. | සුප්පරමනියර් කනගතිප්පිල්ලේ .. .. | 0 0 2·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා ඉඩම් ලබාගැනීමේ ආඥා පණතේ 203වෙනි කොඨාසයේ 6වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි. ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ පෙබරවාරි මස 10වෙනි දින උදේ 10ගේ කනියමට මා ඉදිරිපිටට මන්ඩයිතිවේ ආණ්ඩුවේ මිශ්‍ර පාඨශාලාවට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම්වල ඔප්පුත් ගෙනෙන්ට ඕනෑය.

වර්ෂ 1939ක්වූ දෙසැම්බර් මස 23වෙනි දින යාපනේ කච්චේරියේදීය.

ආර්. බී. හෑෂ්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

———

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ සාධාරණ කාර්යයක් පිණිස, එනම්:—නාවුල්ලේ පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ හයවෙනි කාණ්ඩයේ සරතිබෙන පංකාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ. ඒ ඉඩම්නම්:—

නො. 2ගේ අන්තිම ගම් සිතියමේ නො. 10 අතිරේකය. ගම—කොට්ටවෙල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 213 | පල්ලේකහටදන්ඩෙඩිකුඹුර | කුඹුර .. .. | නාවුල්ලේ පී. එච් කරෝලිස් සිල්වා | 0 2 11·4 |
| 214 | උඩකහටදන්ඩෙඩිකුඹුර .. | වත්ත, අවුරුදු 3ගේ පොල්පැලයක් සහ කොස්පැල 8ක්ද, අවුරුදු 1–2ගේ කෙසෙල් ගස් 11ක්ද, නාරන්ගහක්ද, පුවක්ගස් 3ක්ද, පුලුන්ගස් 3ක්ද තිබේ | නාවුල්ලේ පී. එච්. මාලිස් සිල්වා .. | 0 1 3·1 |
| 215 | එම .. | කුඹුර .. .. | නාවුල්ලේ ඇම්. කේ. හෙන්ද්‍රික් අප්පුහාමි | 0 1 5·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ පෙබරවාරි මස 19වෙනි දින පෙරවරු 11 කනියමට බද්දල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ ජනවාරි මස 9වෙනි දින බද්දල කච්චේරියේදීය.

ඇන්. ජේ. ඉන්ගිංටන්,
ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වම්හ.

---

## රජසන්තක රබර් ඉඩම් බදුදීම.

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුවේ පිහිටි මෙහි පහත සඳහන් රජසන්තක රබර් ඉඩම්වල 1940ගේ දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජනගැණීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර්කර තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජනගැණීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්විලෝප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1940ක්වූ පෙබරවාරි මස 1වෙනි දින පෙරවරු 10 වනතුරු භාරගෙන කඩාබලනවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නිසි බලයලත් ඒජන්ත කෙනෙක් හෝ ඒජන්තවරු ලවා ඉල්ලුම්පත්‍ර හරි ඒවා බව ඔප්පුකරන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එවලේම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසරපත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. එක එක ඉඩමට වෙන් වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

5. ඉඩම් කැලෑවට යන්ට නොදී පවාගැනීමට බදුකාරයා වගකිය යුතුයි.

6. උපමනාකරණ කානු සහ වලවල් ආදිය සහ ඉඩමේ පස්සෝද දෙලවල්වලට යාම වැලැක්විය යුතුයි.

7. ඒජන්ත උන්නාන්සේගේ බලය ඇති යම් කෙනෙකුට බද්ද අවසානයේදී බදුකාරයා විසින් ඉඩම නිරවුල්ව බාරදිය යුතුයි.

8. මෙම ඉඩම්වල බිම්ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අන්දමකින් ඉඩම්වල හරි සම්පූර්ණ බිම්ප්‍රමාණය මෙහි පහත සඳහන් බිම් ප්‍රමාණයට වඩා අඩු බව දෙවනු පෙනීගියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩිනුවහොත් බිම් ප්‍රමාණයේ අඩුලුහුඩුකම් සම්බන්ධව මුදල් ආපසුගැනීමට හෝ අඩුකරගැනීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවට ගනුනොලැබේ.

9. කුපන්දීම සඳහා කාරනා රබර් පාලකතුමාගෙන් දැනගත යුතුය.
10. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැක.

| නො. | | රෙජිස්තර් නො. | | ගම. | | ඉඩම්වල තොරතුරු. | | බිම්ප්‍රමාණය, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | කුකුළුකෝරළේ. | | | | | | |
| 1 | .. | 195 E 3 R 24 | .. | ලේකන්ගොඩ, F. V. P. 251 | .. | 33H සහ 33I | .. | 10 | 2 | 33 |
| | | | | කුරුවිටිකෝරළේ. | | | | | | |
| 2 | .. | 153 S 1 R 103 | .. | හිංදෙල්ලන, F. V. P. 342 | .. | තෙන්නපිටහේන්යාය 119, 124A | .. | 7 | 3 | 0 |
| 3 | .. | 160 E 1 R 18 / 160 E 1 R 19 | .. | බටගොඩ, B. S. P. P. 355 | .. | 111, 125, 127E, 130B, 130G, 130H සහ 131O | | 39 | 0 | 32 |
| 4 | .. | 196 S 1 R 75 | .. | තෙප්පනාව ඉහලගම, F. V. P. 279 | | 11A සහ 11B | .. | 6 | 3 | 33 |
| | | | | කුකුල්කෝරළේ. | | | | | | |
| 5 | .. | 193 S 3 R 194 | .. | අයගම, V. P. 42 | .. | 649, 649B සහ 635 | .. | 5 | 2 | 1 |
| 6 | .. | 193 S 3 R 195 | .. | එම | .. | 145B, 145A, 160B සහ 171D | .. | 5 | 2 | 7 |
| 7 | .. | 193 S 3 R 196 | .. | එම | .. | 166Q | .. | 6 | 3 | 17 |
| 8 | .. | 193 S 3 R 197 | .. | එම | .. | 866O සහ 866J | .. | 7 | 0 | 0 |
| 9 | .. | 193 S 3 R 213 | .. | එම | .. | 857 | .. | 8 | 0 | 0 |
| 10 | .. | 193 E 3 R 11 | .. | එම | .. | 922A, 841P, 832T, 832L | .. | 18 | 2 | 27 |
| 11 | .. | 193 E 3 R 45 | .. | එම | .. | 147 සහ 149 | .. | 10 | 1 | 30 |
| 12 | .. | 193 E 3 R 47 | .. | එම | .. | 174 සහ 184 | .. | 125 | 0 | 0 |
| 13 | .. | 193 E 3 R 48 | .. | එම | .. | 681 | .. | 10 | 0 | 0 |
| 14 | .. | 194 S 3 R 132 | .. | ගෙන්දගල, V. P. 240 | .. | 31 | .. | 6 | 3 | 13 |
| 15 | .. | 194 S 3 R 133 | .. | එම | .. | 5C | .. | 6 | 2 | 20 |
| 16 | .. | 194 S 3 R 134 | .. | එම | .. | 5A | .. | 6 | 2 | 22 |
| 17 | .. | 194 E 3 R 27 | .. | එම | .. | 4 | .. | 14 | 2 | 38 |
| 18 | .. | 194 E 3 R 28 | .. | එම | .. | 4L | .. | 14 | 2 | 26 |
| 19 | .. | 194 E 3 R 29 | .. | පරනල, F. V. P. 221 | .. | 346D | .. | 18 | 0 | 22 |
| 20 | .. | 194 S 3 R 152 | .. | පිටබුර, F. V. P. 241 | .. | 131V | .. | 11 | 2 | 6 |
| 21 | .. | 194 S 3 R 148 | .. | එම | .. | 131Y | .. | 7 | 0 | 9 |
| 22 | .. | 195 S 3 R 201 | .. | වරතෙල්ගොඩ, V. P. 254 | .. | 44 සහ 141 | .. | 6 | 2 | 0 |

වර්‍ෂ 1940ක්වූ ජනවාරි මස 8වෙනි දින
රත්නපුර කච්චේරියේදීය.

කේ. කනගසුන්දරම්,
සබරගමු පලාතේ මහ ඒජන්තතුමා වෙනුවට.

---

## මැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L J 258.

### ආණ්ඩුවේ ඉඩම් බදුදීම.

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම වර්‍ෂ 1940ක්වූ මාර්තු මස 1වෙනි දින පටන් අවුරුදු දෙකකුත් මාස 7කට බදුදීමට මැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දැනුම්දෙමි.

2. මෙම මුද්‍රකරණලද මැන්ඩර් නොහොත් ඉල්ලුම්පත්‍ර වර්‍ෂ 1940ක්වූ පෙබරවාරි මස 16වෙනි සිකුරාද දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඒවා අඩංගු කවරවල පිටපැත්තේ "P. P. 14,349යේ නො. 893 දරණ කට්ටිය බදුගැනීම පිණිසයි" කියා සටහන්කළ යුතුයි. ඉල්ලුම්පත්‍ර හැඬූබව ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටින්ට ඕනෑය.

### කොන්දේසි.

1. වැඩි ඉල්ලුම්කාරයා ගැනුම්කාරයා වේ.

2. හයමාසයකට වැටෙන බදුමුදල විකිණීම තිබුන දවසේම ඇප වශයෙන් මුදලෙන් ගෙවිය යුතුයි. බදු මුදල අවුරුදු කාර්තුවෙන් කාර්තුවට ගෙවන්ට ඕනෑය. එය කාර්තුවක් පැමිණෙන්ට කලින් ගෙවන්ට ඕනෑය. හයමාසෙ ඇප මුදල පියවන්නේ බද්ද අවසානේදීය.

3. බදුකාරයාට අයිතිව තිබෙන්නේ ස්ථිර වගාවක් නොකර ඉඩම වවා එහි ප්‍රයෝජනය ගැනීම පමණක්ය.

4. බදුකාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට ඉඩමේ තිබෙන ගස් කපන්ටවත් දැනට පවතින මායිමක් හෝ වැටක් වෙනස්කරන්ටවත් අවසර නැත.

5. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැටබඳින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බඳින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

6. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්ටත් නාගරික සභාවේ අණපනත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියම්වල හැටියට බදුගෙවන්ටත් ඕනෑය.

7. කිසිම වන්දියක් නොගෙවා බදුකාරයාට මාස තුනකට ප්‍රථම දැනුම්දී ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගේ බලය ලත් ක්‍රියාකරණ කොයිම කෙනෙකුට නමුත් ඉඩමේ භුක්තිය නැවත භාරගැනීමට කොයිවේලාවකදී නමුත් අයිතිවාසිකම තබාගන්නා ඇත.

8. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසි කෙනෙකුට පවරන්ටවත්, නැවත බදුදෙන්ටවත් බදුකාරයාට බලය නැත.

9. කිරි තිබෙන එලදෙන්නු, මීදෙන්නු, එළුවන්, ඌරන් යනාදී සිව්පාවුන්ට ඉඩමට නණකොළ කෑමට එන්ට ඉඩ නොදිය යුතුයි. එවැනි සිව්පාවුන් ඒජන්ත උන්නාන්සේ හෝ උන්නාන්සේගෙන් බලයලත් කෙනෙකු විසින් අල්ලනු ලැබේ. මේ තහනම ගැන නාගරික සභාවේ නිලධාරීන්ට නිසිආකාර කටයුතුකිරීමට බදුකාරයා ඉඩදෙන්ට ඕනෑය.

10. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකලොත් මාසයක් කල්දැන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම හෝ ඉඩම් කොටසට ගෙවන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට ගෙවා තිබෙන බදු මුදලින් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

11. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව කිසිම ගොඩනැගිල්ලක්, මඩුවක්, නොහොත් කොයිම කඩයක් ඉඩමේ ඇතිකරන්ට තහනම්ය.

12. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා බදුකාරයා සහ ඔහුගේ වැඩකරුවන්වත් ඉඩමෙන් අයක්කර ඉඩමේ භුක්තිය ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට නැවත ගැනීමට බලය තිබේ.

13. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්‍ෂේපකිරීමේ බලය ඒජන්ත උන්නාන්සේ වෙත තබාගන්නා ඇත.

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
බස්නාහිර පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1940ක්වූ ජනවාරි මස 10වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉඩමේ තොරතුරු.
මූල් පිහියමේ නො. 14,349

| බිම් කට්ටිය. | පිහිටීම. | අන්දම, | | බිම්තරම, අ. රූ. ප. | | |
|---|---|---|---|---|---|---|
| 893 | නාරාහේන්පිට .. | තණඉඩම | .. | 2 | 1 | 31·75 |

---

### දැන්වීමයි.

බස්නාහිර පළාතේ කොළඹ සහ මීගමු දිස්ත්‍රික්කු සීමාතුල ප්‍රිස්සුබලු රෝගයක් අනතුරුය දැනට ඇති බව ප්‍රිස්සුබලු රෝගය පිළිබඳ ආඥාපනතයයි නම්කරනලද ආඥාපනතේ (333 පරිච්ඡේදය) ii වෙනි වගන්තියේ ප්‍රකාර මට ලැබී තිබෙන බලය පරිදි මෙයින් ප්‍රකාශ කරමි. "බැඳ නොසිටිනා හෝ කෙනෙකුන් විසින් ලනුවක හෝ දම්වැලක ආධාරයෙන් ගෙනයනු නොලබන යම්කිසි බල්ලෙක් ප්‍රසිද්ධ ස්ථානයකදී නොහොත් පාරකදී සම්භවුවහොත් ඌ විනාශකරදමනු ලැබේ."

ඩබ්ලිව්. ඕ. ස්ටීවන්ස්,
බස්නාහිර පලාතේ දිසාපතිතුමා.

වර්‍ෂ 1939ක්වූ දෙසැම්බර් මස 22වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.